JULY TO SEPTEMBER

# NEWSLETTER

VOLUME 33



National Dangerous Drugs Control Board

Ministry of Public Security

## Vision

" Build a Drug Free Health and Secured Nation"

## දැක්ම

"මත්ද්‍රව්‍ය වලින් තොර සෞඛ්‍ය සම්පන්න සහ සුරක්ෂිත ජාතියක් ගොඩනැගීම"

## Mission

"Provide leadership to ensure healthy live and peaceful society free from drug abuse through develop and effective implementation of National policy, by empowering of all related agencies, community and individuals"

## මෙහෙවර

"අදාළ සියලු ආයතන, ප්‍රජාව සහ පුද්ගලයින් බල ගැන්වීමෙන් ජාතික ප්‍රතිපත්තිය සංවර්ධනය කිරීම සහ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළින් මත්ද්‍රව්‍ය භාවිතයෙන් සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහ සාමකාමී සමාජයක් සහතික කිරීමට නායකත්වය ලබා දීම"


**ලිපිනය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය,
නො. 383,
කෝට්ටේ පාර,
රාජගිරිය.

**Tel – 011 2868794 – 6 Fax – 0112 868792 - 1**

**Email – mail@nddcb.gov.lk**

**Fb – National Dangerous Drug Control Board**


- **<u>මගපෙන්වීම</u>**
- **විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මහත්මිය**
  **සභාපතිනිය**
- **භද්‍රානි සේනානායක මහත්මිය**
  **අධ්‍යක්ෂ - පර්යේෂණ**

**සංස්කාරක මඩුල්ල**

තමර දර්ශන - සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ

හංසිකා කේතුමාලි - පර්යේෂණ නිලධාරී

නිලුක්ෂි තිසේරා - පර්යේෂණ නිලධාරී



වර්තමානය වන විට සමාජය තුළ ජීවත්වන මිනිසා මුහුණදෙනු ලබන සමාජ හා ආර්ථිකමය ගැටලු අතර මත්ද්‍රව්‍ය දුර්භාවිතය ද ප්‍රධාන සමාජ ගැටලුවක් බවට පත් වී ඇත. එවන් පසුබිමක "සෞඛ්‍ය සහ මානුෂීය අර්බුද හමුවේ මත්ද්‍රව්‍ය අභියෝග ජයගනිමු" යන තේමාව මූලික කර ගනිමින් මෙවර ජාත්‍යන්තර මත්ද්‍රව්‍ය දුර්භාවිතය හා නීතිවිරෝධී ප්‍රවාහනය පිටුදැකීමේ ජාත්‍යන්තර දිනය යෙදී ඇත. මත්ද්‍රව්‍ය නිවාරණය හා පාලනය පවුල් ඒකකය තුළින් ආරම්භකර සමස්ත සමාජය දක්වා විහිදී යා යුතු පුළුල් ක්‍රියාදාමයක් වේ. ආයතනික වශයෙන් මෙන්ම පුද්ගල මට්ටමෙන් අනාගත දරු පරපුරෙහි සුරක්ෂිතභාවය කෙරෙහි මැදිහත් වී කටයුතු කිරීම පුරවැසියාගේ මූලික වගකීමක් වේ.

සෞඛ්‍ය අර්බුද සහ මානුෂීය අර්බුද ඇතිවීම කෙරෙහි මත්ද්‍රව්‍ය භාවිතයේ ව්‍යාප්තිය සහ ඒ ආශ්‍රිත බලපෑම් හේතුවන අතර එවැනි අර්බුදවලට මුහුණපා සිටින පුද්ගල කණ්ඩායම් සහ ප්‍රජාවන් වෙත සේවාවන් සැපයීමේදී නැවත වරක් එම අර්බුද බාධාවන් වන අවස්ථා ඇත. කුමන අර්බුදයන් මධ්‍යයේ වුවද අඛණ්ඩ සේවාවක් සැපයීම සේවාවන් සපයන ආයතන සහ නිලධාරීන්ගේ වගකීම වේ. අඛණ්ඩ සේවාවක් තහවුරු කිරීම උදෙසා අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සැමවිටම වගකීම් දරන අතර සියලු පාර්ශ්වයන් ඒ සඳහා සක්‍රීය දායකත්වය දක්වනු ඇතැයි අපේක්ෂා කරමි.

**විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු**

**සභාපතිනිය**

# Special Events

## ආරක්ෂක ලේකම් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිරීක්ෂණ චාරිකාවක

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සභාපතිනි විශේෂඥ වෛද්‍ය ප්‍රියංගි අමරබන්දු මැතිනියගේ ආරාධනයෙන් ගරු ආරක්ෂක ලේකම් ජෙනරාල් කමල් ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022.08.24 දින ප්‍රධාන කාර්යාලයේ දී රැස්වීමක් පවත්වන ලදි.

ඒ සඳහා වරුණ ජයසුන්දර (අණදෙන නිලධාරි විශේෂ කාර්ය බලකාය), D. M. සමන් දිසානායක (අතිරේක ලේකම් - සිවිල් ආරක්ෂක හා සංවර්ධන), අතිරේක ලේකම් (ආරක්ෂක අමාත්‍යාංශය) E. A. J. ජයන්ත එදිරිසිංහ මහතා, වෛද්‍ය අනුලා විජේසුන්දර මහත්මිය, අධ්‍යක්ෂ (මූල්‍ය) H. U. R. ෆොන්සේකා මහතා, අධ්‍යක්ෂ (පරිපාලන) D. M. N. චන්ද්‍රාදිත්‍ය මිය යන ආරාධිතයන් සහභාගී වූ අතර මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය සහ ඉදිරි ගමන් මඟ පිළිබඳව සභාපතිතුමිය විසින් හඳුන්වා දෙනු ලැබූ අතර ඒ සඳහා ගරු ආරක්ෂක ලේකම්තුමා විසින් උපදෙස් ලබා දෙන ලදි.









## මැලිබන් සමූහ ව්‍යාපාරය සහ අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය විසින් කරනු ලබන සමාජ සත්කාර වැඩසටහන් මාලාව

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ සහ මැලිබන් සමූහ ව්‍යාපාරයේ ආයතනික බැඳීම තව තවත් ශක්තිමත් කරමින්, මැලිබන් සමූහ ව්‍යාපාරයේ වත්මන් කළමනාකාර අධ්‍යක්ෂිකා කුමුදිකා ප්‍රනාන්දු මැතිතුමියගේ සංකල්පයක් පරිදි මැලිබන් සමූහ ව්‍යාපාරයේ සමූහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී බන්දුල පෙරේරා මහතාගේ අධීක්ෂණය මත ක්‍රියාත්මක කරනු ලබන සමාජ සත්කාර වැඩසටහන් මාලාවේ තවත් එක් සුවිශේෂී වැඩසටහනක් 2022 ජූලි මස 06 වන දින ක්‍රියාත්මක කරන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයන්හි සේවාවන් ලබන සේවාලාභීන්හට කෙටි ආහාර ලබාදීමේ ව්‍යාපෘතියේ පළමු බිස්කට් තොගය මණ්ඩලයේ නිවාරක අධ්‍යාපන හා පුහුණු අංශයේ සහකාර අධ්‍යක්ෂ ප්‍රදීප් කොහොලානේගෙදර මහතා සහ ප්‍රතිකාර හා පුනරුත්ථාපන අංශයේ සහකාර අධ්‍යක්ෂ රෝෂන් ගුණවර්ධන මහතා වෙත ලබාදීම මෙහිදී සිදු විය.

මෙම අවස්ථාව සඳහා මැලිබන් සමූහ ව්‍යාපාරයේ සමූහ මානව සම්පත් හා පරිපාලන කළමනාකරණ නිලධාරී රෝහණ විජේසූරිය මහතා සහභාගී වූ අතර මෙම ව්‍යාපෘතියේ සම්බන්ධීකරණ කටයුතු මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක චාමර කරුණාරත්න මහතා සහ මැලිබන් ආයතනයේ උපදේශිකා ඔෂිකා බුලත්සිංහල මහත්මිය විසින් සිදු කරන ලදි.






## බස්නාහිර පළාත් තලංගම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන සේවාලාභීන් උදෙසා පරිගණක මධ්‍යස්ථානයක් රොටරි සමාජය විසින් පරිත්‍යාග කරන ලදි.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බස්නාහිර පළාත් තලංගම ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ ප්‍රතිකාර ලබන සේවාලාභීන් උදෙසා පරිගණක මධ්‍යස්ථානයක් රොටරි සමාජය විසින් පරිත්‍යාග කරන ලදි.

එම පරිගණක මධ්‍යස්ථානය 2022 අගෝස්තු 19 වන දින ප. ව. 1. 00 යෙදුණු සුබ මොහොතින් අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ගරු සභාපතිතුමියගේ මූලිකත්වයෙන්, ආයුර්වේද කොමසාරිස් ආචාර්ය ධම්මික අබේගුණවර්ධන මහතාගේ සුරතින් විවෘත කරන ලදි. ඒ සඳහා දිස්ත්‍රික් රොටරි සමාජයේ අහමඩ් හුසේන් මහතා, රොටරි සමාජයේ සාමාජික යසිරු ජයතිස්ස මහතා ඇතුළු සාමාජික පිරිස සහභාගී විය.

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය නියෝජනය කරමින්, අධ්‍යක්ෂ (නාමෝද්දිෂ්ඨ හා පෞද්ගලික ප්‍රතිකාර මධ්‍යස්ථාන) කනිෂ්ක කුමාර ද සිල්වා මහතා, අධ්‍යක්ෂ (ප්‍රතිකාර, පුනරුත්ථාපන හා බාහිර සේවා) ටී. ඩබ්. ප්‍රේමසිරි මහතා, සහකාර අධ්‍යක්ෂ (ප්‍රතිකාර හා පුනරුත්ථාපන) රෝෂන් ගුණවර්ධන මහතා සහ තලංගම ප්‍රතිකාර මධ්‍යස්ථානයේ කළමනාකාරතුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගි විය.










## Progress review Meeting and special discussion for effective implementation of prevention, treatment and outreach programmes in Jaffna district.

Progress review meeting and a special discussion was held pm 26th August 2022 in District Secretariat Jaffna with the presence of Government Agent/ District secretary of Jaffna. Additional district secretary, Assistant district secretary, consultant doctor, Development officers, religious leaders, representatives from civil sector organizations and non-governmental organizations and non-governmental organizations, volunteers, Assistant Director – outreach and other officials of the National Dangerous Drug Control Board (NDDCB) were participated for the meeting. Ms. Siyamini Violet, outreach officer Jaffna district arranged and coordinated the meeting with the support of other stakeholders agencies. All the officials were emphasized the expansion of treatment and cares services and strengthen of prevention campaign in Jaffna district. Few conclusive decisions have been made for implementation of prevention and treatment programmes in Jaffna district.









## මුලතිව් පුදුකුඩිඉරිප්පු මධ්‍ය මහා විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම

2022 සැප්තැම්බර් මස 16 වන දින මුලතිව් පුදුකුඩිඉරිප්පු මධ්‍ය විද්‍යාලයේ සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි. මෙම අවස්ථාව පුදුකුඩිඉරිප්පු සංවර්ධන සංසඳය විසින් සංවිධානය කරන ලද අතර සම්පත්දායකයා ලෙස අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය එම්. එම්. ජී. බී. එම්. රෂාඩ් (උතුරු සහ නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක) මහතා සහභාගී විය. මෙම අවස්ථාවට 9, 10 සහ 11 ශ්‍රේණිවල සිසුන් සහභාගී විය.









## 1927 ක්ෂණික දුරකථන ඇමතුම් අංකය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන්

- 2022- 09 -04 දින කෑගල්ල ප්‍රාදේශීය සභාව මඟින් සූදානම් කර තිබූ නව නිපැයුම්කරුවන් සහ ග්‍රාමීය නිෂ්පාදකයින් දිරිමත් කිරීමේ ජංගම සේවය සහ  වෙළඳ ප්‍රදර්ශනයේ දී "මතින් නිදහස් ජාතියක් - සෞභාග්‍යමත් දේශයක්" ගොඩනගනු වස් පන්සිල් සුරකින සමාජයක් ගොඩනැඟීම සඳහා 1927 දුරකථන අංකය හා මත්ද්‍රව්‍ය ප්‍රතිකාර පුනරුත්ථාපන  උපදේශනය පිළිබඳ හඳුන්වා දීම මෙහිදී සිදු විය. මෙහිදී මත්ද්‍රව්‍ය ප්‍රතිකාර උපදේශන සඳහා ස්ථානයක් වෙන් කළ ලංකාවේ පළමු පළාත් පාලන ආයතනය ලෙස කෑගල්ල ප්‍රාදේශීය සභාව ඉතිහාසයට එක් විය. මේ සඳහා කලාපීය කටයුතු පිළිබඳ හිටපු රාජ්‍ය අමාත්‍ය තාරක බාලසූරිය පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන් එක්වූ අතර ඔහු සමඟ විශේෂ සාකච්ඡාවක් ද පවත්වන ලදි.





- 2022-09-05 දින ශ්‍රී ලංකා පොලිසියේ 156 වන අභිමානවත් සැමරුම වෙනුවෙන් පින්දෙණිය පොලිස්  ස්ථානයේ ස්ථානාධිපතිතුමා ප්‍රමුඛ කණ්ඩායම විසින් පින්දෙණිය ජාතික පාසලේ දරුවන් 350 ක් උදෙසා 1927 දැනුවත් කිරීම සහ පන්සිල් සුරකින සමාජයක් බිහිකිරීම, සහ "මතින් නිදහස් ජාතියක් - සෞභාග්‍යමත් දේශයක්" අභිමානවත් දරුවෙක්ගේ වටිනාකම හඳුන්වා දෙන ලදි.





## සබරගමුව සංචාරක කළමනාකරණ පාසලේ දැනුවත් කිරීමේ වැඩසටහන

2022.09.27 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ අධ්‍යාපන හා පුහුණු ඒකකයේ නිවාරණ හා පුහුණු නිලධාරී තිළිණි වීරසේකර මහත්මිය විසින් සබරගමුව සංචාරක කළමනාකරණ පාසලේ සිසුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදි.











## පරිසරය පදනම් කරගත් මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තාක්ෂණික සහාය ඇතිව බලංගොඩදී ඉදිරි වසර දෙක සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති පරිසර පාදක මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහනක් 2022 සැප්තැම්බර් 17 වන දින ආරම්භ කර ඇත. බලන්ගොඩ මහා මස්ජිත් භාරකාර මණ්ඩලයේ අනුග්‍රහය ඇතිව මෙම අවස්ථාවට අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක එම්. එම්. ජී. බී. එම්. රෂාඩ් (උතුරු සහ නැගෙනහිර පළාත් සම්බන්ධීකාරක) මහතා සහභාගීත්වයෙන් පවත්වන ලදි.












## පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයෙහි නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන

පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයෙහි නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයෙහි පවත්වන ලදි. එම වැඩසටහන දින 10 ක් පුරාවට පැවති අතර අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය සිය තාක්ෂණික දැනුම ලබාදෙමින් වැඩසටහන මෙහෙයවන ලදි.

මෙම වැඩසටහන 2022/09/05 දින සිට 2022/09/09 දිනය දක්වා කාලය අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ බාහිර සේවා අංශයේ මූලිකත්වයෙන් සිදු කරන ලදි. මෙම වැඩසටහන උදෙසා පුහුණුලාභීන් 42 දෙනෙකු සහභාගී විය.

**වැඩසටහන මෙහෙය වූ දේශක මඩුල්ල**

- වසන්ත ප්‍රදීප් කුමාර මහතා - පර්යේෂණ නිලධාරී - පර්යේෂණ අංශය
- දිනේෂ් චතුරංග හේරත් මහතා - උපදේශන සහකාර - මාතලේ දිස්ත්‍රික්කය
- බුද්ධි එරංගිකා පෙරේරා මෙනෙවිය - සහකාර බාහිරසේවා - කළුතර දිස්ත්‍රික්කය
- ලක්මාලි උදේශිකා මහත්මිය - සහකාර උපදේශක - කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- ධනුෂ්ක ප්‍රියලාල් මහතා - සහකාර බාහිරසේවා - පොළොන්නරුව දිස්ත්‍රික්කය
- ධනුෂ්ක විජේසිංහ මහතා - සහකාර උපදේශක - කන්දකාඩු ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානය








# RESEARCH DISSEMINATION WORKSHOP

## ශ්‍රී ලංකාවේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් තක්සේරුකරණය පිළිබඳ අධ්‍යයනයට අදාළ පර්යේෂණ සැසිය

ශ්‍රී ලංකාවේ ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානවල ප්‍රමිතීන් තක්සේරුකරණය පිළිබඳ අධ්‍යයනයට අදාළ පර්යේෂණ සැසිය 2022/10/07 වන දින අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදි. එය අධ්‍යක්ෂ පර්යේෂණ භද්‍රානි සේනානායක මහත්මියගේ හා සහකාර අධ්‍යක්ෂ පර්යේෂණ තමර දර්ශන මහතාගේ මගපෙන්වීම යටතේ පර්යේෂණ නිලධාරී වසන්ත ප්‍රදීප් කුමාර මහතා හා පර්යේෂණ නිලධාරී දිලිනි මධුෂානි මහත්මිය විසින් වැඩසටහන මෙහෙයවන ලදි.








# Academic Session

**International Research Symposium – 2022 Contemporary Uncertainties in South Asia Societies, University of Colombo**

Four members of the NDDCB research staff have been presented their research abstracts at the virtual conference and conference committee has allocated a separate panel for the NDDCB under the title of Substance abuse prevention. This was the very first time that NDDCB research staff handled a separate session at the international academic platform.

1. Psychological Attributes of Drug Abuse among Youth and Adolescent
2. Prevalence and Behavioral Pattern of Drug use among University Students
3. Newly Emerging drug use patterns among Beach Boys
4. Newly Emerging drug use patterns among Commercial Sex Workers









# Articles

## අපගාමීත්වය, හංවඩු ගැසීම ඇබ්බැහි වූවන්ගේ සමාජ අනන්‍යතාවය කෙරෙහි සිදු කරන බලපෑම (න්‍යායාත්මක පැහැදිලි කිරීමක්)

අපගාමීත්වය යනු සමාජ පර්යාය තදබල ලෙස බිඳ වැටීමක් ලෙස හඳුනා ගත හැකි වේ. රොබට් කේ. මර්ටන් ට අනුව සමාජයේ පුද්ගලයන් තුළ වන ඉලක්ක සහ ඒවා සපුරා ගැනීමට ගමන් ගන්නා මාර්ගය අතර වන ආතතිය අපගාමීත්වය වශයෙන් හඳුනා ගත හැකිය (Symply Sociology, 2022). සමාජය විසින් බහුතර පුද්ගලයන්ගේ අනුමිතීන්ට යටත්ව සකසා ගන්නා ලද රීතීන් වලට පටහැනිව ක්‍රියා කිරීමට පෙළඹීම තුළ සමාජ පර්යාය බිඳ වැටීමට ලක් වන අතර එවන් චර්යාවන් හි නිරත වීම සමාජ අපගාමීත්වය වශයෙන් පැහැදිලි කළ හැකි වේ. අපගාමීත්වය විශ්වීය සංකල්පයක් වන අතර ඒ ඒ සමාජයන්ට අනුකූල වන පරිදි සමාජ පර්යාය ආරක්ෂා කර ගැනීම උදෙසා වන නීති රීති, දඬුවම් ක්‍රම හා ප්‍රතිරෝධයන් ඒ ඒ සමාජයන්හි නිර්මාණය වී පවතී. ඒ අනුව අපගාමීත්වය යනු එක් චර්යාවකට ලඝුකොට දැක්විය හැක්කක් නොවන අතර ඒ පිළිබඳ සමාජ විග්‍රහය ඉතාම සංකීර්ණ එකක් වනුයේ, ඒ ඒ සමාජයන්ට අනුරූප අපගාමීත්වය නිර්වචනය කිරීම එකිනෙකට වෙනස් ව සිදු වන බැවිනි. උදාහරණ ලෙස හින්දු සමාජයේ ගවමස් අනුභවය අපගාමී චර්යාවක් ලෙස හඳුනා ගන්නා අතර මුස්ලිම් සමාජය අතර ගව මස් අනුභවය සාමාන්‍ය කටයුත්තක් ලෙස සැලකේ. එලෙසම අපගාමීත්වය පිළිබඳ නිර්වචනයන් කාලයත් සමඟ වෙනස් වන ආකාරය ද දැකගත හැකි වේ. තවද සමාජයක් තුළ අපගාමීත්වය පිළිබඳ විග්‍රහය එම ක්‍රියාවෙහි මූලිකයන්, සමාජමය අවස්ථාවන් හා එහි ප්‍රේක්ෂකයන්, ප්‍රතිග්‍රාහකයන් අනුව ද එකිනෙකට වෙනස් වේ. උදාහරණ ලෙස කාන්තා පාර්ශ්වය කලිසම් කමිස ඇඳීම සමාජය තුළ පුද්ගලයන්ගේ විශේෂ අවධානයට ලක් නොවන නමුත් පුරුෂයෙකු කාන්තා ඇඳුම් ඇඳීම අපගාමීත්වය හෝ වෙනත් ලිංගික අනන්‍යතාවයක් සහිත අයෙකු බවට නිර්ණය කිරීමට ඉඩකඩ පවතී. එසේම යුද්ධයක දී පුද්ගලයින් වෙඩි තබා මරා දැමීම මනුෂ්‍ය ඝාතන අපරාධයක් ලෙස තනිව ගෙන නොසලකන නමුත් පුද්ගල වශයෙන් මිනී මැරීම සමාජයක් තුළ බැහැර කරනු ලබයි. මේ අනුව අවස්ථාව, ප්‍රතිචාර දක්වන්නන්, ප්‍රේක්ෂකාගාරය මත අපගාමීත්වය කවරාකාර වන්නේදැයි තීරණය කිරීම සිදු වේ. මෙහිදී අවධානය යොමු කළ යුත්තේ ඉහත සඳහන් කරන ලද සමාජ ප්‍රේක්ෂකාගාරය සමාජයක, සමාජ පාලනයෙහි මුරකරුවන් වශයෙන් ක්‍රියා කරනු ලබන බවයි. යම් ක්‍රියාවක් සිදු කරන විට අප වටා සිටින සමීපතම කණ්ඩායම වන පවුල මෙන්ම ඉන් ඔබ්බට සමස්ථ සමාජය තුළම පිළිගත් සම්ප්‍රදායන් චර්යා රටා එම චර්යාව දෙස විමසිල්ලෙන් බලා සිටී. එකී චර්යාව එම සමාජය විසින් අත්කරගත් අගනාකම්, පිළිගත් සම්ප්‍රදායන් අතික්‍රමණය කරන්නේ නම් ඊට විරුද්ධව නැඟී සිටීමේ බලයක් ස්වයංව ජනනය වන අතර ම එය විසින් අදාළ චර්යාව ඊට අයත් තැනැත්තා අපගාමියෙකු බවට පත් කරනු ලබයි (ජයවීර, 2017).

හොවාඩ් බෙකර් විසින් 1965 දී Outsiders නම් කෘතිය හරහා ගෙනහැර දක්වනු ලැබුවේ අපගාමීත්වය සමාජමය උත්පාදනයක් වන බවයි. බෙකර් විසින් "පිටස්තරයන්" යන යෙදුම භාවිත කරනු ලැබුවේ ඒ ඒ සමාජයන් විසින් එම සමාජ කණ්ඩායමට අදාළ වන ලෙස සකසා ගත් චර්යාවන් සමූහයක් එම සමාජය පිළිගත් මට්ටමට තහවුරු වී ඇති අවස්ථාවක ඊට පරිබාහිරව සිදු වන චර්යාවන් අපගාමී චර්යාවන් වන බවත්, එම චර්යාවෙහි යෙදෙන්නන් තවදුරටත් අපගාමීන් හෙවත් පිළිගත් චර්යාවන් සහිත කණ්ඩායමෙන් පිටස්තර පුද්ගලයින් යන අදහස ගෙනහැර දැක්වීම සඳහා වේ. එහෙත් එසේ පිටස්තරයෙකු ලෙස ලේබල් කරන පුද්ගලයාට එම හැසිරීම සම්බන්ධයෙන් වෙනත් අදහසක් තිබිය හැකි නමුදු ඔහුව විනිශ්චයට ලක් කරන පුද්ගලයන් හට ඒ සඳහා නීතිමය වශයෙන් නැතත් සමාජමය අයිතිවාසිකමක් ඇති බව විශ්වාස කරයි (UKEssays, 2018). මේ අර්ථයෙන් ගත් කළ අපගාමීත්වය බොහෝ විට සමස්ථ සමූහයෙහි පැවැත්මට බාධාකාරී චර්යාවක් විය හැකි නමුදු එසේ බාධාකාරී නොවන මට්ටමකදී වුවද අදාළ සමූහයේ පොදු පිළිගැනීම් අතික්‍රමණය කරන්නේ නම් අපගාමී ලෙස සැලකිය හැකි වේ. ඒ අනුව අපගාමීත්වය යනු චර්යාවේ ගුණාත්මක ස්වරූපය මතම රඳා පවතින තත්ත්වයකට වඩා අනිකා විසින් ස්ථාපනය කරනු ලබන වාරණ හා රීති මත රඳා පවතින්නක් වේ. අපගාමියා යනු අනෙකා විසින් අති සාර්ථක ලෙස අපගාමීත්වය නමැති ලේබලය අලවනු ලැබූවකු ලෙස සැලකිය හැකි වේ. යම් යම් අවස්ථාවලදී අපගාමී ලෙස හැඳින්වෙන චර්යාවන් අවසාන වුවද අපගාමියා ලෙස අලවනු ලබන ලේබලය දීර්ඝකාලීන වන අතර බොහෝ විට එය ජීවිත කාලයටම වලංගු වේ. මෙවැනි අපගාමී චර්යාවන් මොනවා ද? යන්න සහ ඒවාට හංවඩු ගැසීම සිදු වන්නේ කවරාකාරයෙන් ද? යන්න ඒ ඒ සමාජයට අනන්‍ය වූ තත්ත්වයන් මත රඳා පවතින අතර එක් සමාජයක සුචරිතවාදී චර්යාවක් සමහර අවස්ථාවලදී වෙනත් සමාජයක් විසින් අපගාමී ලෙස ලේබල් කරමින් පවතිනු දැකිය හැකිය. කෙසේ නමුත් අපගාමී චර්යාවක දී අනිකා විසින් අලවනු ලබන අපගාමී ලේබලය පුද්ගලයාගේ සමාජ අනන්‍යතාවය කෙරෙහි දැඩි ලෙස බලපෑම් කරනු ලබයි.

හොවාඩ් බෙකර් විසින් ඉදිරිපත් කරනු ලබන තවත් සංකල්පයක් වනුයේ, සදාචාර ව්‍යවසායකයන් (Moral entrepreneurs) නමැති සංකල්පයයි (Sociology Index, 2020). මෙමගින් ඔහු විස්තර කරනු ලබන්නේ, අපගාමීත්වය යන්න අදාළ චර්යාව විසින්ම විස්තර කර නොගන්නා බැවින් එය සමාජය වෙත යොමු කොට සමාජයෙහි අවධානය ඒකරාශී කිරීම මගින් තමාගේ සමූහය තුළ නොවිය යුතු යමක් සිදු වන බවට වන හැඟවීම සිදු කිරීමේ මූලිකයා ලෙස සදාචාර ව්‍යවසායකයන් කටයුතු කරන බවයි. යම් පුද්ගල සමූහයක් තුළ මත්ද්‍රව්‍ය ජාවාරම මෙතෙක් සිදු නොවූ මුත් පුද්ගලයින් කිහිප දෙනෙකු එම චර්යාවෙහි නිරත වන්නේ නම්, ඒ සම්බන්ධව පොදු සමූහය දැනුවත් කොට එය අපගාමී චර්යාවක් ලෙස හා ඉවත් කර ඉවත දැමිය යුතු චර්යාවක් වශයෙන් අනෙකුත් පුද්ගලයින් දැනුවත් කිරීම හැඳින්විය හැකිය. බෙකර් දක්වන ආකාරයට සදාචාර ව්‍යවසායකයන්ගේ කාර්යය වනුයේ, තමා අවට සිදු වන දෑ අපගාමී චර්යාවක් ලෙස අර්ථ ගන්වා සංවිධානාත්මක වශයෙන් ඒවාට එරෙහිව කටයුතු කිරීමයි. විශේෂයෙන් අදාළ චර්යාවන් සිදු කරන තැනැත්තන්

වැරදිකරුවන් ලෙස හුවා දැක්වීමයි. මෙම තත්ත්වය බොහෝ දුරට, රටක ආයතනික මට්ටමින් නීතිමය රාමුව යටතේ සිදු කරන ආකාරය ද දැකිය හැකි වේ. මෙහිදී සදාචාර ව්‍යවසායකයින් ලෙස සැලකෙන්නේ, සිය උසස් කාර්යය හේතුවෙන් සමාජය වරදින් මුදවා ගැනීමට ඉදිරිපත් වන්නන් ලෙසයි (ජයවීර, 2017).

තවදුරටත් මේ සම්බන්ධව සාකච්ඡා කිරීමේදී එරික් ගුඩ් (Eric Good) විසින් අපගාමී අනන්‍යතා සම්බන්ධව කරුණු දක්වනු ලබයි. අපගාමී ලෙස හංවඩු ගැසීමෙන් පසුව එය විසින් ද පුද්ගලයාට තත්ත්වයන් නිර්මාණය කර දීම සිදු වේ. විශේෂයෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කරන්නෙකු ලෙස හංවඩු ගැසූ විට එකී තැනැත්තන්ට සාමාන්‍ය ජනයාගේ යම්කිසි බියක් හෝ ප්‍රතික්ෂේප කිරීම මුසු ප්‍රතිරෝධයක් පහළ වේ. ඒ තුළින් එම පුද්ගලයා නව වශයෙන් තම අපගාමී අනන්‍යතාවය අඛණ්ඩවම ඉදිරියට ගෙන යාමට අදහස් කරයි. එය එක්තරා මට්ටමකින් එම පුද්ගලයා තුළ අපගාමී අනන්‍යතාවය හා තත්ත්වයන් ස්ථිර කිරීමක් ලෙස ගෙනහැර දැක්විය හැකිය.

ගුඩ් විසින් අපගාමීත්වයෙහි අංග 06 ක් විස්තර කොට දක්වා ඇත.

01. අතිශයෝක්තිය (Exagerration)

අපගාමීත්වය සම්බන්ධව පවතින ලක්ෂණ මේවාය යනුවෙන් එල්බගෙන සිටින විශ්වාසයන් සම්බන්ධව මෙහිදී සාකච්ඡා කරනු ලබයි. උදාහරණ ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරන්නන් සලකන විට ඔවුන්ගෙන් පෙන්නුම් කරනු ලබන ලක්ෂණ ලෙස සොරකම් කිරීම, වගකීම් විරහිත බව, පාලනයකින් තොර බව, ගෘහස්ථ හිංසනය සිදු කිරීම ආදිය ඔවුන් සියල්ලටම අනන්‍ය ලක්ෂණ ලෙස හුවා දැක්වීම මෙහි දී අදහස් කරනු ලබයි.

02. කේන්ද්‍රීයභාවය (Centrality)

අපගාමියෙකු ලෙස හංවඩු ගසනු ලබන තැනැත්තාගේ ජීවිතය තුළ අපගාමී ස්වභාවය කේන්ද්‍රගත ලෙස ක්‍රියාත්මක වීම මෙමගින් අදහස් කෙරේ. එනම් ඔහුගේ එදිනෙදා ජීවිතයේ ක්‍රියාකාරකම්, ඔහුගේ චින්තන රටාව ආදිය ද අපගාමී ලේබලයට අනුකූල වන ලෙස සකස් වේ. මත්ද්‍රව්‍ය භාවිත කරන්නෙකු උදාහරණ ලෙස ගතහොත් ඔහු මත්ද්‍රව්‍ය ගැනීම හේතුවෙන් සමාජ විරෝධියෙකු ලෙස හංවඩු ගැසූ විට ඔහුට එදිනෙදා ජීවිතයේ වගකීම් පැවරීමට කිසිවකුත් උත්සුක නොවේ. එම වගකීම් ඔහුට ඉෂ්ඨ කළ හැකි වුවද එම වගකීම් කිසි ලෙසකත් ලබා නොදේ. එසේම මත්ද්‍රව්‍ය ලබා ගන්නෙකු ලෙස තමාට ඇලවී ඇති ලේබලය හේතුවෙන් සමාජ අවස්ථාවන් කෙරෙහි එළඹීමට, තමන්ගේ අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට හෝ රැකියාවකට යාමට පවා ඔවුන් නොපෙළඹෙයි. තමා සමාජයෙන් කොන් වූ වෙනම අනන්‍යතාවයක් සහිත අයෙකු බවට මානසික මට්ටමක් එම පුද්ගලයා විසින්ම ගොඩනගා ගනියි.

03. අඛණ්ඩත්වය (Persistence)

මෙමගින් අදහස් කරනු ලබන්නේ, අපගාමී චර්යාවක් ලේබලීකරණය වීම තුළ එය අඛණ්ඩතාවයට පත් වීමයි. උදාහරණයක් ලෙස, හෙරොයින් භාවිතයට හුරු වූ අයෙකු ප්‍රතිකාර ක්‍රමවේදයකින් අනතුරුව හෙරොයින් භාවිතය අතහැරිය ද "මත්ද්‍රව්‍ය භාවිත කරන්නා" ලෙස සමාජය විසින් එම අපගාමී චර්යාව තුළ ඔහුට අලවනු ලබන ලේබලය ඉවත් වන්නේ නැත. "මත්ද්‍රව්‍ය භාවිත කරන්නා" යන හංවඩුව දිගින් දිගටම පවතී. ඒ

හේතුවෙන්ම ඔහුට සමාජය තුළ සාමාන්‍ය පුද්ගලයෙකු ලබන වරප්‍රසාද අහිමි වී යාමට මෙන්ම නිතරම සැක කටයුතු තත්ත්වයන්ට මුහුණ දීමට සිදු වේ.

04. උභයීකරණය (Dichotonomizing)

අපගාමී තත්ත්වයට පත් වන පුද්ගලයා නිතරම අපගාමී චර්යාව හා අපගාමී නොවන තත්ත්වයන් තුළ දෝලනය වෙමින් පවතී. උදාහරණ ලෙස හෙරොයින් භාවිත කරන්නෙකු අපගාමියෙකු ලෙස හංවඩු ගැසූ පසු ඔහු එම චර්යාව නැවත සිදු කළා හෝ නොකළා වුවද අපගාමියා හෝ අපගාමී නොවන තැනැත්තා යනුවෙන් වරින් වර ඔහු දෙස බාහිර සමාජය දකින ප්‍රතිරූපය දෝලනය වේ. මෙම දෝලනය වීම ඔහුට ඇලවුණු අපගාමී ලේබලයෙහි පැවැත්ම තීරණය කරනු ලබයි.

05. සමජාතියත්වය (Homogeneity)

මෙමගින් අදහස් කරනුයේ, අපගාමී චර්යාවන් සිදු කරන සියලුම දෙනා එකම වර්ගීකරණයක ලා සලකා වෙන් කොට වර්ග කිරීමයි. මත්ද්‍රව්‍ය භාවිත කරන්නන්, වාණිජ ලිංගික වෘත්තිකයන්, මනෝ ව්‍යාධීන්ගෙන් පෙළෙන්නන්, සමලිංගිකයන් එකම කොටසක් ලෙස වර්ග කිරීම මෙයට උදාහරණ වේ.

06. පොකුරුකරණය (Clustering)

අපගාමීත්වය යනු චර්යාවන් ගණනක පැකේජයක් ලෙස භාර ගැනීමය යන්න මෙම පොකුරුකරණය මගින් හඳුන්වනු ලබයි. එනම්, අපගාමී ලෙස වර්ග කරනු ලබන චර්යාවන් හුදෙකලා ලෙස නොපවතින අතර එම චර්යාවන් රාශියක් එකට ගොනු වී පවතින බව මෙමගින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස මත්ද්‍රව්‍ය භාවිත කරනු ලබන කාන්තාවක් හුදෙක්ම මත්ද්‍රව්‍ය භාවිතයට පමණක් නිරාවරණය නොවන අතර පවුලෙන් නොසලකා හැරීම, පවුලේ අය සමග ආරවුල් ඇති කර ගැනීම, වාණිජ ලිංගික වෘත්තිය හෝ සොරකම වැනි කාර්යයන් හි නිරත වීම ආදී ලෙස චර්යා පොකුරක් එක් චර්යාවක් සමඟ ඈඳීමට පටන් ගැනේ. මේ හේතුවෙන්ම එවැනි කාන්තාවක් සමාජය තුළ අනිවාර්ය වශයෙන්ම වෙන්කොට සැලකීමට භාජනය වන අතර ගෞරවනීය සමාජය විසින් අපගාමී ලෙස ලේබල් කරනු ලැබේ. එසේම තනි කිරීමට හෝ වෙන්කර තැබීමට පෙළඹේ (ජයවීර, 2017).

මෙලෙස යම් කිසි පුද්ගලයෙකු තුළ මෙම ක්‍රියාකාරීත්වය සිදු කිරීමට ලැබෙන සමාජ දායකත්වය මත එම පුද්ගලයා තුළ අපගාමී අනන්‍යතාවය ඇති කරනු ලබයි. මර්ෂ් රේ (Marsh Ray) 1964 දී ප්‍රකාශ කළ ආකාරයට යම් අපගාමී චර්යාවක් සිදු කරන්නන්ට සිදු නොකරන්නන් විසින් ඇති කරනු ලැබූ බලපෑම හේතුවෙන් ඔවුන් අපගාමී අනන්‍යතාවයක් තමන් තුළම ඇති කර ගනියි. එම අනන්‍යතාවය තුළ බොහෝ විට අන්තර්ගත වනුයේ පිරිහුනු ස්වයං ශක්තිය, කළකිරීම, අපරාධකාරී ගති ලක්ෂණවලට නැඹුරු මානසික තත්ත්වයක් වේ. උදාහරණ වශයෙන් මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවකුට ඇබ්බැහි නොවූවන් විසින් ඇති කරනු ලබන ඇබ්බැහිකාරී අනන්‍යතාවය විසින් ඔවුන් මත්ද්‍රව්‍යවලින් මිදුනා වුවද නැවත භාවිතයට ඔවුන්ව යොමු කරවනු ලබයි. එනම් ප්‍රතිකාරයකින් පසුව යහපත් අන්දමින් කල් ගත කළ ද පවුලේ සාමාජිකයින්, අසල්වැසියන්, නෑදෑයන් විසින් එම පුද්ගලයාව මත්ද්‍රව්‍යවලින් හරියාකාරව අත්මිදී ඇත්දැයි සැක ඇති කර ගන්නා අතර ඔවුන්ව විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කරනු ලබයි. තමාව සැක

කිරීම හේතුවෙන් ඇති වන සිත් තැවුල හා බලාපොරොත්තු කඩ වීම පදනම් කර ගනිමින් පුරුදු චර්යාව වෙත නැවත යොමු වීම සිදු වේ.

මේ ආකාරයට හංවඩුවට ලක් වීම තුළින් පුද්ගලයාගේ සමාජ අනන්‍යතාවය වෙනසකට ලක් කරන අතර එහි හැඩය පුද්ගලයා, ස්ථානය, ප්‍රදේශය, සංස්කෘතිය ආදී තත්ත්වයන් මත තරමක් වෙනසකට භාජනය වුවද මූලික වශයෙන් සිදු වන වෙනස පැහැදිලි ලෙසම ඔවුන්ගේ සමාජ අනන්‍යතාවයට බලපෑම් කරනු ලබයි. අපගාමී හංවඩුවට පාත්‍ර වූ තැනැත්තා අපගාමීත්වයේ ඇලී ගැලී එයම දිගින් දිගටම පවත්වාගෙන යාම ඉන් පසුව සිදු වේ. මෙම තත්ත්වය අර්වින් ගොෆ්මාන් (Erving Goffman) විසින් පැහැදිලි කරනු ලබයි. මෙම තත්ත්වය තුළ දී අපගාමීත්වය ප්‍රවාහකයන් ලෙස ඉදිරියට ගමන් කරන අතර අපගාමී වාහකයාගේ චර්යාව පුරුද්දක් හෝ නිත්‍ය ලෙසට ජීවන රටාව තුළට අන්තර්ග්‍රහණය වේ. මේ තත්ත්වය විසින් එම පුද්ගලයා අපගාමී උපසංස්කෘතිය තුළට තල්ලු කර දැමීම සිදු කරයි. **(CRAM.2022)** උදාහරණ ලෙස හෙරොයින් භාවිත කරන්නෙකුට අදාළ අපගාමී චර්යා ලක්ෂණ ඔහුට පවතින්නේ දැයි ලේබලීකරණය කොට මත්ද්‍රව්‍ය භාවිත උපසංස්කෘතිය වෙත තල්ලු කර දැමීම සිදු කරයි. උදාහරණ ලෙස හෙරොයින් භාවිත කරන්නෙකුට අදාළ අපගාමී චර්යා ලක්ෂණ ඔහුට පවතින්නේදැයි ලේබලීකරණය කොට මත්ද්‍රව්‍ය භාවිත උපසංස්කෘතිය වෙත තල්ලු කර දැමීමෙන් අනතුරුව ඔහු විසින් එම උපසංස්කෘතියට අදාළ ධර්මතා හා අගනාකම්, ජීවන රටාව තම ජීවිතයට වැඩි වශයෙන් ආදා ගැනීම සිදු වේ. එවිට ඔහු සාමාන්‍ය පොදු සමාජයෙන් ක්‍රමයෙන් ඉවත් වීම සිදු වේ. නැන්ට් ඩේවිස් (Nanette Davis) ද මේ සම්බන්ධව අදහස් දක්වා ඇති අතර සමාජයේ පවත්නා රීති මූලික වශයෙන් උල්ලංඝනය කිරීම සමාජ විද්‍යාඥයින්ට අනුව ප්‍රාථමික අපගාමීත්වය වන අතර මත්ද්‍රව්‍ය අත්හදා බැලීම, ලිංගික කාර්යයන් සඳහා මුදල් අය කිරීම වැනි කාරණා ඊට උදාහරණ වේ. ද්වීතියික අපගාමීත්වය යනු අනිකා විසින් එය අපගාමී ලෙස සැලකීම හා ප්‍රතිරෝධය දැක්වීම ලෙස පහර දීම, විරෝධය දැක්වීම, ගැරහීමට එරෙහිව ක්‍රියාත්මක වීම වැනි කාරණාවන් වේ. යම් පුද්ගලයෙකු ප්‍රාථමික අපගාමීත්වයට පත් වීමෙන් පසුව ද්වීතියික අපගාමීත්වයට ලක් වීම ස්වයංක්‍රීව සිදු වන අතර එය පුද්ගලයෙකු අපගාමී උපසංස්කෘතිය වෙත තල්ලු වී යාම තුළින් සමාජ පීඩනයෙන් ගැලවී සිටීමට ආරක්ෂාකාරී ආවරණයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම තත්ත්වය අවසාන වශයෙන් ඇබ්බැහිවූවකු, මත්ද්‍රව්‍ය ඇබ්බැහි උපසංස්කෘතිය තුළ පැවැත්ම ස්ථිර කරවන අතර සාමාන්‍ය පුද්ගලයෙකුගේ සමාජ අනන්‍යතාවයෙන් වෙනස්ව ඇබ්බැහිවූවකු ලෙස වෙනස් වූ අනන්‍යතාවයක් ගොඩනැගීම සිදු වේ (ජයවීර, 2017).

**මූලාශ්‍ර :**


**Nickerson, C. (2022, Aug 31). Deviance in Sociology: Definition, Theories & Examples. Simply Sociology. Available at:** https://simplysociology.com/deviance-examples-sociology.html **(Accessed : 2022)**

**UKEssays. (November 2018). Howard Becker Studies in the Sociology of Deviance. Available at:** https://www.ukessays.com/essays/criminology/howard-becker-studies-in-the-sociology-of-deviance-criminology-essay.php?vref=1**(Accessed : 2018)**

**Sociology Index, (2020). MORAL ENTREPRENEURS CONSTRUCT DEVIANCE. Available at:** http://sociologyindex.com/moral_entrepreneurs.htm#:~:text=Moral%20entrepreneurs%20are%20those%20who%20construct%20deviant%20behavior.,openly%20visible%20and%20active%20agents%20of%20social%20control. **(Accessed : 2020)**

**CRAM.(2022). Meaning Of Career Deviance. Available at:**https://www.cram.com/essay/Meaning-Of-Career-Deviance/P38AAC553GZ3Q#:~:text=The%20term%20career%20deviance%20brings%20a%20whole%20new,into%20the%20law%20or%20even%20long%20term%20patterns. **(Accessed : 2020)**

**ජයවීර, සුධීර (2017) අපගාමීත්වය සහ සමාජ පාලනය. අහස මීඩියා වර්ක්ස්, මහරගම.**

**තුෂාරි වලස්මුල්ලගේ**

**සහකාර පර්යේෂණ නිලධාරී**

**පර්යේෂණ අංශය**

# දුර්වල වූ පුද්ගල ජීවන කුසලතා මත්ලෝලී සමාජයක පෙරනිමිත්ත ද?

පුද්ගලයා මව්කුසින් බිහි වූ දින සිට පරිසරයට අනුගත වීමේ අභියෝගයට මුහුණ දෙනු ලැබේ. මවගේ සහ පවුලේ ඥාතීන්ගේ උණුසුම් පහසින් ඔහු පළමුවරට සමාජයීය ජීවියකු ලෙස සබඳතා පැවැත්වීමේ පළමු පාඩම උගනියි. මවගේ පෝෂණය, රැකවරණය, සෙනෙහස, ආදරය සමග වැඩෙන දරුවා ක්‍රමිකව පවුල නැමැති කුඩා ඒකකයෙන් ඉවත් වී මහ සමාජය වෙත ප්‍රවේශ කරනු ලබන සුවිශේෂී ආයතනය පෙර පාසල වේ. පෙර පාසල් අධ්‍යාපන දරුවාගේ සමාජයීය ජීවිතයේ මූලික අඩිතාලම වේ. නව යහළුවන් හඳුනාගැනීම, මිතුරු සබඳතා පවත්වා ගැනීම, බෙදාහදා ගැනීම, සහයෝගය වැනි ඔහුගේ පෞරුෂ සංවර්ධනයට අවශ්‍ය මූලික පාඩම ඔහු එහිදී ඉගෙන ගනු ලැබේ. මෙහිදි තමන් පවුල් තුළ අත්කර ගත් භූමිකාවට වෙනස්ව සමාජය තුළ තම භූමිකාව වර්ධනය කරගැනීම පුද්ගලයා වයස, අධ්‍යාපනය සහ අත්දැකීම් අනුව ක්‍රමිකව වර්ධනය කර ගත යුතු වේ. මෙය අප ජීවන කුසලතා සංවර්ධනය ලෙස හඳුන්වනු ලැබේ.

සැබැවින්ම පුද්ගලයෙකුට අවශ්‍ය වන මූලික ජීවන කුසලතා මොනවා ද? ජීවන කුසලතා පොදුවේ අර්ථ ගැන්වෙන්නේ නිවැරදි තීරණ ගැනීම, ගැටලු විසඳීම, විවේචනාත්මක සහ නිර්මාණශීලී චින්තනය, ඵලදායි සන්නිවේදනය, සෞඛ්‍ය සම්පන්න සබඳතා ගොඩනගා ගැනීම, අන් අය සමග සංවේදනයෙන් යුතුව කටයුතු කිරීමට මිනිස්සුන්ට උපකාරී වන මනෝ සමාජයීය නිපුණතා සහ අන්තර් පුද්ගල කුසලතා සමුදායක්" ලෙසය. මෙහි දී පුද්ගලයා කායික, මානසික, සමාජයීය සහ චිත්තවේගික වශයෙන් තම ජීවන කුසලතා සංවර්ධනය කර ගැනීම අවශ්‍ය වේ. මූලික ජීවන කුසලතා මගින් පුද්ගලයා දෛනික ජීවිතයේ මුහුණ දෙන අභියෝග, හැඟීම් කළමනාකරණය, කුසලතා සංවර්ධනය සහ මානසික හා ශාරීරික හැකියාවන් වර්ධනය කිරීම, තමන් සහ අන් අය පිළිබඳව අවබෝධ කර ගැනීමට ඉගෙනීම තුළින් සැබෑ හැකියාවන් යථා තත්ත්වයට පත් කිරීමට මෙන්ම සමාජයේ

සාමකාමීව එකට ජීවත් වීමට සහ ඵලදායි තීරණ ගැනීමට උපකාරි වේ.

තවදුරටත් ජීවන කුසලතා සංවර්ධනය කිරීම තුළින් ආතති කළමනාකරණය, චිත්තවේගික කළමනාකරණය, ධනාත්මක චින්තනය, ආත්ම අභිමානය, සංවේදනය, සවන්දීම කුසලතා, අන්තර් පුද්ගල සබඳතා කළමනාාකරණය, ආරවුල් විසඳීම, ධනාත්මක සබඳතා ගොඩ නගා ගැනීම, ඉලක්ක ගොඩනැගීම, තීරණ ගැනීම, ගැටලු විසඳීම, නායකත්වය, විශ්වාසනීය සන්නිවේදනය සහ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය වේ.

වර්තමානයේ ශ්‍රී ලාංකීය සමාජය දෙස අවධානය යොමු කරන කල්හි පුද්ගල ජීවන කුසලතා සංවර්ධනය පිළිබඳව ඇති අවධානය සහ අවබෝධය ඇල්මැරුණු ස්වභාවයක පවතී. ඒ සඳහා දෙමාපියන්ගේ සිට නූතන අධ්‍යාපන රාමුව ද එක සේ වගකිව යුතු වේ. නූතන තරගකාරී අධ්‍යාපන රටාව තුළ ශිෂ්‍යයා අසීමාන්තිකව ආතතියට, වෙහෙසට, විඩාවට පත් වී ඇත. ඒකාකාරී අධ්‍යාපන රටාව තුළ විරැකියාව උත්සන්න වීම තුළ රැකියාවක් ලබා ගැනීමේ අභියෝගය තුළ පුද්ගලයා ආතතියට පත් කර ඇත. අධිපරිභෝජනවාදි සමාජ රටාව තුළ භූමිකා නඩත්තුව ඉදිරියේ පුද්ගලයා ආතතියට පත් වී ඇත. සම්පත් විෂමතාවය සහ ළඟා විය හැකි සීමිත අවස්ථාවන් තුළ පුද්ගලයා ආතතියට පත් වී ඇත. මෙලෙස දිගින් දිගට පුද්ගලයා ආතතියට නිරාවරණය වීම තුළ ජීවන කුසලතා සංවර්ධනය යන ක්ෂේත්‍රය තුළ ආතති කළමනාකරණයට සුවිශේෂී ස්ථානයක් හිමි වේ.

ආතතිය සෑම විටම පුද්ගලයාට අහිතකර වේ ද? අප සියලු දෙනාම දෛනික ජීවිතයේ අඩු වැඩි වශයෙන් ආතතියට මුහුණ දෙන්නෙමු. ගොඩනගා ගත් ජීවන කුසලතා අනුව ආතතිය අපට ධනාත්මකව හෝ ඍණාත්මකව බලපානු ලැබේ. ධනාත්මකව ඇතිවන ආතතිය පෙළඹවීම වර්ධනය කිරීමටත්, නිර්මාණශීලීත්වය ඇති කිරීමටත්, කායිකව මානසිකව පුද්ගලයා ශක්තිමත් කිරීමත් උපකාරි වේ.

ජීවන කුසලතා දුර්වල වූ පුද්ගලයෙකු ආතතියට මුහුණ දීම ඉහත ක්‍රියාවලියට හාත්පසින්ම වෙනස් වේ. ඔහු සෑම විටම දෛනික ජීවිතයේ අභියෝග තර්ජනයක් ලෙස සලකනු ලැබේ. එතුළින් පුද්ගලයා කෙටිකාලීනව හෝ දිගුකාලීනව ආතතියට ලක්වේ. නිදර්ශනයක් ලෙස දරාගැනීමේ කුසලතා සහිත ශිෂ්‍යයෙකු විභාගය අසමත් වීම නව අවස්ථාවක් ලැබීම ලෙස ධනාත්මක අභිප්‍රේරණය කර ගනු ලබන අතර දරාගැනීමේ කුසලතා රහිත ශිෂ්‍යයෙකු එම අවස්ථාවේ ආතතියට ලක් වී ඔහුට අනර්ථකාරී ක්‍රියාවන් අනුගමනය කිරීම හෝ මත්ද්‍රව්‍ය භාවිතය ට යොමු වීම දක්නට ලැබේ.

මෙලෙස පුද්ගලයා ආතතියට ලක් වීමට බලපාන පොදු සාධක දෙකකි. එනම්,

1 අභ්‍යන්තර සාධක

2 බාහිර සාධක වශයෙනි.

අභ්‍යන්තර සාධක තුළ දී පුද්ගලයාගේ ජීවන රටාවේ වැරදි තෝරා ගැනීම්, ඍණාත්මක ස්වයං කථනය, අහේතුවාදී/ අතාර්කික සිතුවිලි මෙන්ම පහසුවෙන් ආතතියට පත්වන පුද්ගල පෞරුෂ ලක්ෂණ බලපානු ලැබේ.

බාහිර සාධක ලෙස ප්‍රධාන ජීවන සංසිද්ධි වෙනස් වීම, භෞතික පරිසරය, ආයතනික නීති රීති, සමාජයීය බලපෑම මෙන්ම එදිනෙදා මුහුණ දෙන ගැටලු බලපානු ලැබේ.

මෙම ආතතිකාර සාධක අභිමුඛව ජීවන කුසලතා දුර්වල පුද්ගලයා දිගුකාලීන ආතතියට ලක් වේ. දිගුකාලීනව ආතතියට ලක් වූ පුද්ගලයාගේ කායික, මානසික, චර්යාත්මක සහ චිත්තවේගික ලක්ෂණ විද්‍යාමාන වේ. එනම්,

**කායික ලක්ෂණ**

- හිසරදය, ඉරුවාරදය, බඩේ කැක්කුම
- ඔක්කාරය, කරකැවිල්ල, වෙව්ලීම, අත්ලට දහඩිය දැමීම
- පපුවේ වේදනාව, වේගවත් හෘද ස්පන්දනය
- නිදන්ගත තෙහෙට්ටුව, මාංශ පේෂි ආතතිය
- පාචනය හෝ මළබද්ධය

**චර්යාත්මක ලක්ෂණ**

- වගකීම කල්දැමීම හෝ නොසලකා හැරීම
- ආහාර රුචිය නැති වීම හෝ අධික ලෙස ආහාර ගැනීම
- නොසන්සුන් පුරුදු (නියපොතු කෑම)
- නින්දේ ඇතිවන බාධා
- ආක්‍රමණශීලි හෝ ආවේගශීලී ක්‍රියා

**මානසික ලක්ෂණ**

- මතකය පිළිබඳව ගැටලු
- අවධානය යොමු කිරීමට නොහැකි වීම
- තීරණ ගැනීමේ නොහැකියාව
- දුර්වල විනිශ්චය
- ඍණාත්මක ආකල්පය
- කනස්සල්ල හෝ නොනවතින සිතුවිලි
- චිත්තවේගික ලක්ෂණ
- නුරුස්සබව හෝ ක්ෂණික කෝපය
- නොසන්සුන් බව
- හැඟීම්වලින් වෙලා යාම
- අධික පීඩාව හෝ කනස්සල්ල
- අසම්පූර්ණ බව
- දුක හෝ බිය

මෙවැනි රෝග ලක්ෂණ එකක් හෝ කිහිපයක් පුද්ගලයා තුළ හට ගැනීම නිසා ඔහුගේ නිවැරදි තීරණ ගැනීමේ හැකියාව දුර්වල බැවින් සහනය පතා වෙනත් අයකු පොළඹවනු ලැබීමෙන් හෝ ස්වයං පෙළඹුම මගින් දැඩිව මත්ද්‍රව්‍යයට හෝ ඖෂධ අවභාවිතයට යොමු වීම දක්නට ලැබේ.

මතට ඇබ්බැහි වූ පුද්ගලයන්ගේ ජීවන ශෛලිය සහ ඔවුන්ගේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී ප්‍රකට වන ප්‍රධාන ලක්ෂණය වන්නේ, මනා ලෙස සංවර්ධනය වූ ජීවන කුසලතාවන්ගේ ඌනතාවය වේ. වත්මන් තරුණ පරපුර පවුලේ තත්ත්වය, අධ්‍යාපන තත්ත්වය, සහ සමාජ තත්ත්වයෙහි වෙනසක් නොමැතිව මත්ද්‍රව්‍ය සඳහා යොමු වීම දක්නට ලැබේ. එහි ප්‍රධාන ලක්ෂණය වන්නේ, දුර්වල වූ ජීවන කුසලතා ය. පුද්ගල මත්ද්‍රව්‍ය භාවිතය විද්‍යාමානවන ප්‍රතිඵලය වන අතර එහි හේතුව දිගුකාලීන ආතතිය වී එය ඇති වීමට හේතුව පුද්ගලයා හට තම දෛනික ජීවිතයේ අභියෝගයන්ට මුහුණ දීමේ කුසලතා රහිත වීමය.

**බුද්ධි එරංගිකා පෙරේරා**
**සහකාර බාහිරසේවා නිලධාරි**
**කළුතර දිස්ත්‍රික්කය**

## උපදේශන මනෝවිද්‍යාව සඳහා ප්‍රවේශයක්

සංකීර්ණ සමාජ පද්ධතියක් තුළ ජීවත් වන මිනිසාට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවන විවිධ දුෂ්කරතා, විවිධ ගැටලුවලින් මිදීම සඳහා තවත් අයෙකුගේ පිහිටක් අවශ්‍ය කෙරේ. එකී අවශ්‍යතාවය ඉටු කරනු ලබන ක්‍රියාවලියක් ලෙස මනෝවිද්‍යාත්මක උපදේශනය හැඳින්විය හැකිය. මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රයෙහි ව්‍යවහාරික මනෝවිද්‍යාවට අයත් විෂය ශාඛාවක් ලෙස උපදේශන මනෝවිද්‍යාව පෙන්වා දිය හැකිය. උපදේශනය යන වචනයෙහි නිරුක්තිය පිළිබඳ විමසීමේදී, ලතින් භාෂාවේ වචනයක් වන consilium යන වචනයෙන්, උපදේශනය සඳහා භාවිත ඉංග්‍රීසි වචනය වන counselling යන්න බිහි වී තිබේ. මුල් කාලීනව මෙම වචනය භාවිත කොට ඇත්තේ උපදෙස් දීම යන අර්ථයෙනි.

නමුත් counselling යන ඉංග්‍රීසි වචනයෙන් අදහස් වන්නේ, සෘජු උපදෙස් දීමක් නොවේ. සරල අර්ථයෙන් විමසා බලන කල උපදේශනය යනු යම්කිසි මානසික ගැටලුවක් සහිත පුද්ගලයෙකුට ඔහු හෝ ඇය සතුව පවතින කුසලතා උපයෝගි කොට ගනිමින්, ඔහුගේ හෝ ඇයගේ ගැටලුව ඔහු විසින් හෝ ඇය විසින් විසඳා ගැනීමේ ක්‍රියාදාමයට උපදේශකවරයා විසින් මග පෙන්වයි. උපදේශනය යන්න උපදෙස් දීමක් ද? මග පෙනවීමක් ද? යන ව්‍යාකූලත්වය ඒ සම්බන්ධයෙන් විමසීමේ දී ඇති වේ. උපදේශනය යන්නට නිශ්චිත අර්ථකථනයක් ලබා දීම අසීරු වන මුත් විවිධ පුද්ගලයන්ගේ මත පිළිබඳව විමසීමෙන් ඒ පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගත හැකි වනු ඇත. ඒ අනුව මනෝවිද්‍යාත්මක උපදේශනය සඳහා ඉදිරිපත් කර ඇති අර්ථකථන පහත දැක්වේ.

''උපදේශනය යනු පුද්ගලයන්ගේ හෝ පවුල්වල හෝ පුද්ගල කණ්ඩායම්වල මානසික සෞඛ්‍ය, සුභසාධනය අධ්‍යාපනය හා වෘත්තීය අරමුණු සවිබල ගැන්වීම සඳහා වන වෘත්තීය සබඳතාවයකි'' (ඇමරිකානු උපදේශන සංගමය)

''විශේෂයෙන් පුද්ගල, සමාජ හෝ මනෝවිද්‍යාත්මක ගැටලු සහ අසීරුතා සහිත උපදේශනලාභියෙකුට එම ගැටලුව විසඳා ගැනීමට, විශේෂයෙන් පුහුණු වූ පුද්ගලයෙකු විසින් වෘත්තීය පදනමක් මත පිහිටා සහාය වීමේ සහ මග පෙන්වීමේ ක්‍රියාවලිය උපදේශනයි.'' (ඔක්ස්ෆර්ඩ් lX වන සැකසුම)

උපදේශනය යනු ගැටලුවක් හෝ ප්‍රශ්නයක් ඇති පුද්ගලයෙකුට හෝ කණ්ඩාමකට හෝ ප්‍රජාවකට ගුණාත්මක අතින් උසස් මෙන්ම සතුටුදායක තීරණ ඔවුන් විසින්ම ගැනීමට උදව් කිරීමේ එක්තරා සාරවත් ක්‍රියාවලියක් ලෙස උපදේශනය හැඳින්විය හැකි අතර එය ගතට හා සිතට හදවත ද එකතු කිරීමේ ක්‍රියාවලියකි. සමස්ථයක් වශයෙන් ගත්විට උපදේශනය යනු උපදෙස් දීමක් නොවේ. උපදේශනලාභියාගේ ගැටලුව කෙටි කිරීමක් ද නොවේ. උපදේශනලාභියාට ඇති වූ ගැටලුව තමාට ද මීට පෙර ඇති වී ඇත්නම්, එම අවස්ථාවේදී තමා කළ කී දෑ කිරීමට උපදේශනලාභියාට පවසන්නේ නැත. තමාගේ වටිනාකම් පද්ධතීන් මත පදනම්ව උපදේශනලාභියාගේ ගැටලුව තමාගේ දෘෂ්ඨි කෝණයෙන් දකින්නේ ද නැත. සෑම විටම ගැටලුවක් දෙස බැලිය යුත්තේ,

උපදේශනලාභියාගේ දෘෂ්ටි කෝණයෙනි. උපදේශනලාභියා චිත්තවේගාත්මක වන විට උපදේශකවරයා චිත්තවේගාත්මක වන්නේ ද නැත. උපදේශනය පිළිබඳ විමසීමේදී උපදේශනයෙහි මාදිලි දෙකක් හඳුනා ගත හැකිය.

(1) **ඍජු උපදේශනය** - උපදේශකවරයා සජීවීව කතා කරයි. මේ තුළ දී යම් භූමිකාවක් නිරූපනය කරයි. ප්‍රශ්න අසමින් යම් යම් ක්‍රියාවන් යෝජනා කරයි.

(2) **වක්‍ර උපදේශනය** - මෙය උපදේශනලාභී කේන්ද්‍රීය ප්‍රවේශය සහ පුද්ගල කේන්ද්‍රීය යන නම් වලින් ද හඳුන්වනු ලබයි. මෙහිදී යම් කිසි පුද්ගලයෙක් ගැටලුවකට මුහුණ දී ඇති විට ඔහු හෝ ඇය ස්වේච්ඡාවෙන්ම ගැටලුවට උපකාරයක් අපේක්ෂාවෙන් පැමිණේ. එහිදී උපදේශකවරයා එම ගැටලුව විසඳා ගැනීමට, උපදේශනලාභියා සතුව පවතින සහජ වටිනාකම, එම ගැටලුව විසඳා ගැනීමට පවතින ස්වභාවික ශක්‍යතාවය සංවර්ධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ඔහු සතුව පවතින ශක්‍යතාව පෙන්වා දෙයි. එවිට උපදේශනලාභියා විසින්ම සිය ගැටලුව විසඳාගනී. මේ ආකාරයට උපදේශන ක්‍රියාවලිය තුළ පවතින උපදේශන මාදිලි පිළිබඳ කෙටියෙන් විග්‍රහ කළ හැකිය.

## උපදේශනයේ අරමුණු

උපදේශන ක්‍රියාවලිය තුළ උපදේශනයේ අරමුණු පිළිබඳ විමසීමේදී මෙය ප්‍රධාන වශයෙන් ආකාර තුනකට පෙන්වා දිය හැකිය.

**සංවර්ධනය (development)**

**වැළැක්වීම (prevention)**

**ප්‍රතිකාරය (treatment)**

මෙකී ප්‍රධාන අරමුණු තුනට අමතරව උපදේශනයේ ඇති අනෙකුත් අරමුණු ලෙස,

- අන්තර්ඥානය ලබා දීම.
- සබඳතා ගොඩනගා ගැනීමට උපකාර කිරීම.
- ස්වයං අවබෝධය ලබා දීම.
- ආත්ම සාක්ෂාත්කරණය සහ පුද්ගලකරණය.
- ගැටුම් විසඳීම.
- මනෝ අධ්‍යාපනය ලබා දීම.
- සමාජ කුසලතා සාක්ෂාත්කරණය.
- ප්‍රතිස්ථාපනය,

## උපදේශනයේ පියවර

කිසියම් මානසික අක්‍රමතාවයකින් පෙළෙන පුද්ගලයෙකුට උපදේශනය සිදු කළ යුතු පියවර පිළිබඳ කථා බහ කිරීමේදී පොදුවේ පිළිගත් පියවරයන්ගේ එකතුවක් පහත පරිදි පෙළ ගැස්විය හැකිය. එහිදී මූලිකව සබඳතා ගොඩනගා ගැනීම සුවිශේෂී වේ. ඒ තුළ උපදේශකවරයාට ඔහුට හෝ ඇයට ඇති මානසික අක්‍රමතා තත්ත්වය හඳුනාගෙන එය තක්සේරුකරණය කළ හැකි වේ.

**අවසන්කරණය හා පසු විපරම**

**මැදිහත්කරණය**

**අරමුණු පිහිටවීම**

**තක්සේරුකරණය**

**සබඳතා ගොඩනැගීම**

පසුව එම අක්‍රමතා තත්ත්වයට අනුව අරමුණු පිහිටවීම සිදු කළ යුතු වේ. එනම් ඔහුට හෝ ඇයට කුමන මානසික අක්‍රමතාවයක් පවතීදැයි මනෝ උපදේශකයා විසින් තේරුම් ගනු ලබයි. පසුව මනෝ උපදේශකයා විසින් එම ගැටලුව විසඳීමට මැදිහත් වනු ලබයි. එහිදී ඇති වන්නා වූ සුවිශේෂී කාරණාව නම්, අදාළ සිද්ධියට අනුව තීන්දු තීරණ ගැනීමේ පූර්ණ අයිතිය උපදේශනලාභියාට ලබා දෙනු ලබයි. එනම් ඒ මොහොතේ මනෝඋපදේශකයා අපක්ෂපාතී බේරුම්කරුවෙකු ලෙස ක්‍රියා කරනු ලැබේ. මෙකී සමස්ථ ක්‍රියවලිය අවසානය හා පසු විපරම මනෝ උපදේශකයා විසින් සිදු කරනු ලබයි. මෙහිදී විශේෂ අවධානයක් උපදේශන ආචාරධර්ම පිළිබඳ සැලකිලිමත් විය යුතුය. එනම් මෙම තත්ත්වය නැවත ඇති වීමට ඉඩ කඩ ඇතිදැයි සොයා බලා ඊට පිළියම් යෙදීම සිදු කරයි. අවසාන වශයෙන් සඳහන් කළ යුතු සුවිශේෂී කරුණ නම් උපදේශන ක්‍රියාවලියට යාමට මත්තෙන් ඒ සම්බන්ධ අධ්‍යාපනික සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ. එනම් මනෝවිද්‍යාව, සමාජවිද්‍යාව, අපරාධවිද්‍යාව පිළිබඳ මූලික උපාධියක්, මනෝ උපදේශනය සම්බන්ධයෙන් පශ්චාත් උපාධියක් හෝ අවම වශයෙන් ඩිප්ලෝමාවක් (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසන් සභාව විසින් අනුමත) සහ සුදුසුකම්ලත් උපදේශකයෙකු යටතේ අවම වසරක හෝ පුහුණුවක් ලබා ගෙන තිබීම අතිශය වැදගත් වේ.

**එන්.ජී. ධනුෂ්ක සම්පත් විජේසිංහ**

**සහකාර උපදේශන නිලධාරී**

# NDDCB Treatment Centers



Talangama
"Talangama" Prevention, Treatment & Center
172, Shanthi Mawatha Talangama
Tel : +94 11 2788090
Fax : +94 11 2788090
Email : sethsevana@nddcb.gov.lk




Nawadiganthaya
"Nawadiganthaya" Prevention, Treatment & Rehabilitation Centre
Urapola, Nittambuwa
Tel : +94 33 2283060
Fax : +94 33 2283060
Email : navadiganthaya@nddcb.gov.lk



Galle
"Galle" Prevention, Treatment & Rehabilitation Centre
Unawatuna Galle
Tel : +94 91 2224443
Fax : +94 91 2224443
Email : mithsevana@nddcb.gov.lk



Kandy
"Kandy" Youth Prevention, Treatment& Rehabilitation Centre
Mampitiya Estate Handessa, Peradeniya
Tel : +94 81 2315504
Fax : +94 81 2315504
Email : methsevana@nddcb.gov.lk

**Tel – 011 2868794 - 6**
**Web -https://www.nddcb.gov.lk/**
**Fb – National Dangerous Drug Control Board.**